ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.10.28

ඩබ්.මනෝජ් අසංක
58, බක්මිටියාව,
අම්පාර.

පැමිණිලිකාර පාර්ශවය

1. ප්‍ර.පො.ප. ඩී.එම්.එන්. මනෝජ් දිසානායක
ස්ථානාධිපති (හිටපු),
පොලිස් ස්ථානය, දමන.
(වර්තමාන සේවා ස්ථානය :
පොලිස් ස්ථානය, කඹුරුපිටිය)
2. උ.පො.ප. බණ්ඩාර
පොලිස් ස්ථානය, දමන.
3. පො.සැ. 19538 සුමනසේකර
පොලිස් ස්ථානය, දමන.
(වර්තමාන සේවා ස්ථානය :
පොලිස් ස්ථානය, යාපනය)
4. පො.සැ. 39481 ලක්මාල්
පොලිස් ස්ථානය, දමන.
5. පො.කො. 96027 පාලිත
පොලිස් ස්ථානය, දමන.

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය : HRC/AM/63/24/S/PL</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකාර ඩබ්.මනෝජ් අසංක මහතා විසින් 2024.05.31 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර කාර්යාලය වෙත ඉහත අංක දරණ පැමිණිල්ල ගොනුකර ඇත. 2024.05.27 වන දින පැමිණිලිකරු තම ඥාති සහෝදරයෙකු සමඟ තම නිවසට පැමිණෙමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින් සිව්දෙනෙකු පැමිණිලිකරුව පාරේ නවත්වා ගෙන පරීක්ෂාවට ලක් කළ බවත්, එහිදී ගංජා තිබෙනවාද කියා විමසූ බවත්, තමා සතුව එවැනි කිසිවක් නොමැති බව එම පුද්ගලයින්හට පැවසූ බවත්, එහෙත් තමා හට අත් විලංගු දැමීමට ඔවුන් කටයුතු කළ බවත්, එම

අවස්ථාවේ දී එම පුද්ගලයින් සිව්දෙනා දමන පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් නිලධාරීන් බව දැනගත් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, අත්අඩංගුවට ගැනීමට පැමිණි පොලිස් නිලධාරීන් සිව්දෙනා අතරින් පාලිත මහතා හැර අනෙක් නිලධාරීන් විසින් ගංජා ඉල්ලමින් තමාගේ කකුල් දෙකට සහ තුනටියට පහර දුන් බවත්, පසුව පොලිස් ජීප් රථයෙන් ප.ව. 5.30ට පමණ පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත්, තමා හට සිදු කළ පහරදීම් හේතුවෙන් ඉතා අපහසුවෙන් පොලිස් ස්ථානය තුළට ගමන් කළ බවත්, අත්අඩංගුවට ගත් දිනට පසු දින එනම්, 2024.05.28 වන දින අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තමා හට අධිකරණයෙන් ඇප ලබා දුන් බවත් පැමිණිලිකරු විසින් 2024.12.27 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත.

එසේම, පොලිස් නිලධාරීන් සිදු කළ පහරදීම් හේතුවෙන් තමා හට ඇතිව තිබූ ශරීර අපහසුතාවයන් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට අධිකරණයෙන් පිටත්ව එදිනම අම්පාර රෝහල වෙත ගිය බවත්, එහිදී දින තුනක් රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමා ජීවත් වන්නේ ගොවිතැන් කිරීමෙන් බවත්, මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ දී තම බිරිඳ ද ගැබිණි තත්ත්වයෙන් පසු වූ බවත්, රෝගී තත්ත්වයෙන් පසුවන තම දෙමව්පියන්ද රැකබලා ගන්නේ තමා විසින් බවත්, තමා කිසිදු විටක නීති විරෝධී වැඩ වලට සම්බන්ධ නොවන බව ගම්වාසීන් සියලු දෙනාම දන්නා කරුණක් බවත්, මෙම අත්අඩංගුවට ගැනීම සහ පහරදීම නිසා තමාගේ ජීවිතයට ද කැළලක් ඇති වූ බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම, දමන පොලිස් ස්ථානයේ නිලධාරීන් කිසිදු සොයා බැලීමකින් තොරව තමාහට පහර දීම කණගාටුවට කරුණක් බවත්, තමා ගංජා නැමැති මත්ද්‍රව්‍ය භාවිත කර නොමැති බවත්, එහෙත් තමාට විරුද්ධව නඩු පැවරීමට හේතු නොමැති නිසා පොලිස් නිලධාරීන් විසින් ඔවුන් ළඟ තිබූ ගංජා ප්‍රමාණයක් බලෙන් දමා අසත්‍ය නඩුවක් පවරන ලද බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එසේම, මෙම සිදුවීමට පෙර ද දමන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තමාගේ කිසිම වරදක් නොමැතිව තමා හට ගමෙන් පිටව යන ලෙසත් නැත්නම් අවුරුද්දකට සිරගත කරන බව පවසන ලද බවත්, මෙම ක්‍රියා හේතුවෙන් තමා දැඩි මානසික පීඩාවකට පත්ව ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එබැවින් දමන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සිදු කරන ලද මෙම අමානුෂික පහරදීම සම්බන්ධව එකී නිලධාරීන්ට විරුද්ධව කටයුතු කර තමා හට නිදහසේ ජීවත් වීමට කටයුතු සලසා දෙන ලෙස පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව 1 වන වගඋත්තරකාර දමන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (හිටපු) ප්‍ර. පො.ප. ඩී. එම්.එන්. මනෝජ් දිසානායක මහතා විසින් අංක 2044/2024 සහ 2024.08.05 දිනැති වාර්තාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. 2024.05.27 වන දින පැය

14.00ට මෙම පැමිණිලිකරු වන ඩබ්. මනෝජ් අසංක යන අයව ඔහුගේ නිවසට යැමට ඇති බොරළු පාරේ දී බලපත්‍රයක් නොමැතිව කැනබිස් සැටිියිවා එල් නොහොත් ගංජා ලඟ තබා ගැනීම මත 1984 අංක 13 දරණ විෂ මත්ද්‍රව්‍ය අබිං හා අන්තරාදායක ඖෂධ පනතේ 78(5)(අ) වගන්තිය යටතේ උ.පො.ප. බණ්ඩාර, පො.සැ. 19538 සුමනසේකර, පො.සැ. 39481 ලක්මාල් සහ පො.කො. 96027 පාලිත යන නිලධාරීන් කණ්ඩායම විසින් අත්අඩංගුවට ගෙන ඇති බව එකී වාර්තාව මගින් දක්වා ඇත. එසේම, පැමිණිලිකාර ඩබ්. මනෝජ් අසංක යන අයව වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කර නොමැති බවත්, ඔහු හට පොලිස් නිලධාරීන් විසින් කිසිඳු පහරදීමක් සිදුකර නොමැති බවත් එකී වාර්තාව මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළ 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර නිලධාරියා විසින් 2024.10.04 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇත. එකී ප්‍රකාශයේ දැක්වෙන්නේ 2024.05.27 වන දින වැටලීම් රාජකාරි සඳහා තමා, පො.සැ.19538 සුමනසේකර, පො.සැ.39481 ලක්මාල්, පො. කො.96027 පාලිත යන නිලධාරීන් සමඟ අංක WPABV 2306 දරන ත්‍රීරෝද රථයෙන් බක්මීටියාව ප්‍රදේශයට පිටව ගිය බවත්, එහිදී බක්මීටියාවේ විජේගේ පුතා වන රසික යන අය ළඟ ගංජා ඇති බවට තමා හට පුද්ගලික ඔත්තුකරුවෙකු විසින් දැනුම් දුන් බවත්, එකී තොරතුරට අදාළව ඉහත නිලධාරීන් කණ්ඩායම සමඟ රසික යන අයගේ නිවසට යන අවස්ථාවේ ඔහුගේ නිවසට හැරෙන හන්දියේ බෝක්කුව අසල රසික යන අය සිටිනු දැක ඔහුව හඳුනා ගත් පසුව එම ස්ථානයේ ත්‍රීරෝද රථය නවතා රසික නොහොත් මනෝජ් යන පැමිණිලිකරුව පරීක්ෂාවට ලක් කළ බවත් ය.

එසේම, පැමිණිලිකරු ඇඳ සිටි කොට කලිසමේ ඉදිරි වම්පස සාක්කුවේ පත්තර කඩදාසියකින් ඔතන ලද කුඩා පැකට් එකක් තිබී හමුවූ බවත්, තමා එය පරීක්ෂා කිරීමේදී ගංජා නොහොත් කැනබිස් සැටයිවා එල් බවට තම වසර 36ක සේවා පලපුරුද්ද අනුව හඳුනා ගන්නා ලද බවත්, පසුව ගංජා ළඟ තබා ගැනීම සඳහා නීත්‍යානුකූල බලපත්‍රයක් තිබේ ද යන්න පැමිණිලිකරුගෙන් විමසා සිටීමේදී බල පත්‍රයක් නොමැති බව ඔහු පැවසූ පසුව බලපත්‍රයක් නොමැතිව ගංජා නොහොත් කැනබිස් සැටයිවා එල් ළඟ තබා ගැනීමේ වරද කියා දී එදින පැය 14.00ට පමණ අත්අඩංගුවට ගන්නා ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරුව පරීක්ෂා කිරීමේ දී පෙනීමට තුවාල කිසිවක් නොතිබූ බවත්, පසුව අනිකුත් නිලධාරීන් සමඟ කිරුම් මිනුම් කටයුතු පැමිණිලිකරු ඉදිරියේම සිදුකර පැමිණිලිකරු සතුව තිබූ ගංජා ප්‍රමාණයෙහි ශුද්ධ බර ග්‍රෑම් 10ක් ලෙස රැගෙන ගිය ඉලෙක්ට්‍රොනික් තරාදියේ සටහන් වූ පසුව සැකකරු හා නඩු බඩු ද රැගෙන පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේ පන්නලගම දනුකගේ කඩය ළඟදී පැමිණිලිකරුට තේ බීමට අවශ්‍ය බව පැමිණිලිකරු පවසා සිටි බැවින් පැමිණිලිකරුට එම කඩයෙන් තේ රැගෙන දුන් බවත්, එම මුදල් තමා විසින් කඩයට ගෙවීම සිදු කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

අනතුරුව පැමිණිලිකරු පොලිස් ස්ථානයට රැගෙන විත් සැකකරු හා නඩු භාණ්ඩ උපසේවා රාජකාරියෙහි යෙදී සිටි කා.පො.සැ.6589 සරෝජනී නිලධාරිනියට පැය 16.20 ට බාර දෙන ලද බවත්, මෙම පැමිණිලිකරු විසින් ඔහුට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට සිදු කරන ලද සියලු චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, ඔහුට පහරදීමක් සිදුවූවා නම් ඔහු පොලිස් ස්ථානයේ රඳවා සිටි කාලය තුළදී උප සේවා නිලධාරියාට හා කාර්යභාර නිලධාරියාට එසේත් නොමැති නම් ස්ථානාධිපතිතුමාට පවසා සිටීමට ඔහුට කාලය තිබුණ බවත්, එසේත් නොමැති නම් ඔහු ගරු අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී එය පැවසීමට ඔහුට අවස්ථාව තිබූ බවත්, එහෙත් එසේ පැමිණිලි කර නොමැති බවත් 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, පැමිණිලිකරු විසින් "පොලිසියෙන් පහර දුන්නා කියා මානව හිමිකම් එකට පැමිණිල්ලක් කරන බවත්, මානව හිමිකම් එකට ඇති බයට පොලිසියෙන් එන්නේ නැති බවත්, එවිට ඔහු ළඟ තිබෙන අලෙවි කරගත හැකි බවත්" පැවසූ බවට තමා හට පුද්ගලික ඔත්තුකරු විසින් පවසා සිටි බවත්, මෙම පැමිණිලිකරු මීට පෙර ද 2023.02.05 දින ගංජා වගාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, පැමිණිලිකරු විසින් අධිකරණයේ දී එකී වරද පිළිගෙන ඇති බවත්, ඒ සඳහා රු.2000ක දඩයක්ද නියම කර ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

3 වන, 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් විසින් ද 2024.10.04 වන දින කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ ලබා දී ඇති අතර එකී සියලුම ප්‍රකාශ වල අන්තර්ගතය ඉහත කී 2 වන වගඋත්තරකාර උ.පො. ප. බණ්ඩාර නිලධාරියාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු හා සමාන වේ.

<u>නිරීක්ෂණ</u>

2024.05.27 දින වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුව ගංජා මත්ද්‍රව්‍යා ළඟ තබා ගත් බවට අසත්‍ය චෝදනා නඟා නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම සහ 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු හට සිදු කළ පහරදීම සම්බන්ධයෙන් විමර්ශනය කර සහනයක් සලසන ලෙසට ඉල්ලා පැමිණිලිකරු විසින් මෙම පැමිණිල්ල කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

2024.05.27 වන දින පැය 07.00ට දමන පොලිස් ස්ථානයේ සුලු වැරදි තොරතුරු සටහන් පොතේ පිටුව 114 සහ ඡේදය 230 යටතේ යොදා ඇති පිටවීමේ සටහන ප්‍රකාරව 1 වන වගඋත්තරකාර ස්ථානාධිපතිගේ නියෝග පරිදි 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර, 3 වන වගඋත්තරකාර පො. සැ. 19538 සුමනසේකර, 4 වන වගඋත්තරකාර පො.සැ. 39481 ලක්මාල් සහ 5 වන වගඋත්තරකාර පො.කො.96027 පාලිත යන නිලධාරීන් විසින් අංක WP ABV 2306 දරණ ත්‍රීරෝද රථයෙන් වැටලීම් රාජකාරි සඳහා පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, 2024.05.27 වන දින පැය 16.20ට දමන පොලිස් ස්ථානයේ සුලු වැරදි තොරතුරු සටහන් පොතේ පිටුව 125 සහ ඡේදය 233 යටතේ 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර නිලධාරියා විසින් යොදා ඇති පැමිණීමේ සටහන අනුව වැටලීම් රාජකාරි සඳහා යමින් සිටියදි පුද්ගලික ඔත්තුකරුවෙකු විසින් බක්මීටියාවේ රසික යන අය ළඟ ගංජා ඇති බවට ලබා දුන් තොරතුරට අදාළව උඩවත්ත රාලලගේ ළහිරු තාරක රසික යන අය සොයා නිවසට යන අවස්ථාවේ නිවසට යාමට ඇති බොරළු මාර්ගයේ රසික යන අය සිටි බවත්, 2 වන වගඋත්තරකරු විසින් ඔහුව පරීක්ෂා කිරීමේ දී ඔහු ඇඳ සිටි දුඹුරු පාට කොට කළිසමේ වම් පැත්තේ ඉදිරි සාක්කුවේ පත්තර කැල්ලක ඔතන ලද පාර්සලයක් හමු වූ බවටත්, එය පරීක්ෂා කිරීමේ දී ගංජා නොහොත් කැනබිස් සැටයිවා එල් එහි තිබූ බවටත්, පසුව ගංජා ළග තබා ගැනීම සඳහා බලපත්‍රයක් ඇත්දැයි ඔහුගෙන් විමසීමේ දී බලපත්‍රයක් නොමැති බව දන්වා සිටි බවටත්, එබැවින් ඔහුට ගංජා නොහොත් කැනබිස් සැටයිවා එල් ළඟ තබා ගැනීමේ වරද කියා දී පැය 14.00ට පමණ එම ස්ථානයේ දීම අත්අඩංගුවට ගන්නා ලද බවටත්, එම සැකකරුගේ නම හා ලිපිනය වීමසීමේ දී ලිපිනය: බක්මීටියාව පන්නල්ගම, අම්පාර බවත්, නම: වර්ණකුලසූරිය මනෝජ් අසංක කුලසූරිය ගෙස පැවසූ බවටත් සටහන් යොදා ඇත. ඒ අනුව පැමිණිලිකාර ඩබ්. මනෝජ් අසංක යන අය බලපත්‍රයක් නොමැතිව කැනබිස් සැටයිවා එල් ළඟා තබා ගැනීමේ වරදට 1984 අංක 13 දරණ විෂ මත්ද්‍රව්‍ය අබිං හා අන්තරාදායක ඖෂධ පනතේ 78(5)(අ) වගන්තිය යටතේ අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එසේවුවද පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ තමා සතුව ගංජා මත්ද්‍රව්‍ය නොතිබුණු බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් ඔවුන් සතුව තිබූ ගංජා ප්‍රමාණයක් පැමිණිලිකරු සතුව තිබූ බවට දක්වා අසත්‍ය චෝදනාවක් නඟා නඩුවක් ගොනු කිරීමට කටයුතු කළ බවයි. එහෙත් එය තහවුරු වන ආකාරයේ කිසිදු සාක්ෂියක් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

පැමිණිලිකරු වෙත අම්පාර මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කර ඇති අංක 770/2024 සහ 2024.05.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරු 2024.05.28 වන දින පැය 15.32ට අම්පාර මහ රෝහල වෙත ඇතුළත්ව ඇති බවත්, 2024.05.29 වන දින පෙ.ව. 09.40 ට අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පැමිණිලිකරුව පරීක්ෂා කර ඇති බවත් පෙනී යයි. එකී අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි 'රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය' යටතේ "බක්මටියාව පාලම ළඟදී බණ්ඩාර මහත්තයයි තව තුන් දෙනෙකුයි පොලු වලිනුයි අතින් පයින් ගැහුවා. මට දෙපාරක් වමනේ ගියා. ඇස් බොඳ වෙලා පේන්නේ. කන් ඇහෙනවත් අඩුයි" යනුවෙන් පැමිණිලිකරු විසින් ලබා දෙන ලද ඉතිහාසය සටහන් කර ඇත.

එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරුගේ ශරීරයේ පහත පරිදි තුවාල තුනක් පැවති බවට අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සටහන් කර ඇත.

1. රෝගියාගේ පපුවේ ඉහල වම්පස සෙ.මී. 3x4 ප්‍රමාණයේ තැලීමක්,
2. පපුවේ පිටුපස දකුණු මැද සෙ.මී. 3x4 ප්‍රමාණයේ තැලීමක්,

3. පපුවේ පිටුපස දකුණුපස පහළ සෙ.මී. 4x5 ප්‍රමාණයේ තැලීමක්, වශයෙනි.

මෙම තුවාල ත්‍රිත්වයම මොට ආයුධයකින් සිදු වූ බරපතළ නොවන තුවාල වන බවත්, රෝගියා විසින් තමාට පහර දීමක් සිදු වූ බවට ලබා දෙන ලද ඉතිහාසය සමඟ සැසඳෙන බවත් අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත රැගෙන යාමෙන් අනතුරුව 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර නිලධාරියා විසින් 2024.05.27 වන දින පැය 16.20ට දමන පොලිස් ස්ථානයේ සුලු වැරදි තොරතුරු සටහන් පොතේ පිටුව 125 සහ ඡේදය 233 යටතේ යොදා ඇති සටහනෙහි පැමිණිලිකාර ඩබ්. මනෝජ් අසංක යන අය ඔහු විසින් පරීක්ෂා කළ බවත්, පෙනීමට තුවාල කිසිවක් නොමැති බවත්, නිදන්ගත රෝග නොමැති බවට දන්වා සිටි බවත් සඳහන් කර ඇත. එසේම, 2024.05.27 වන දින උපසේවා රාජකාරියෙහි යෙදී සිටි කා.පො.සැ. 6589 සරෝජිනී නම් නිලධාරිනිය විසින් 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර නිලධාරියාගේ සටහනට පහළින් සටහන් යොදා ඇති අතර, එහිදී තමා විසින් පැමිණිලිකාර ඩබ්. මනෝජ් අසංක යන අය හරියාකාරව භාරගත් බවත්, ඔහුව පො.සැ 63670 විජේතුංග නිලධාරියා යොදවා පරීක්ෂා කළ බවත්, මතුපිටින් පෙනීමට තුවාල හෝ අසනීප නොමැති බවට එකී නිලධාරියා විසින් දන්වා සිටි බවත් කා.පො.සැ. 6589 සරෝජිනී නම් නිලධාරිනිය විසින් සටහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව පොලිස් ස්ථානය වෙත රැගෙන ආ අවස්ථාවේ දී ඔහුගේ ශරීරයේ තුවාල කිසිවක් නොතිබූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දමන පොලිස් ස්ථානයේ රඳවා ගැනීමේ ලේඛනය අනුව 2024.05.28 වන දින පෙ.ව. 09.30ට පැමිණිලිකරුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ගිය බවට සටහන් කර ඇත. එදිනම එනම්, 2024.05.28 වන දින ප.ව. 3.32ට පැමිණිලිකරු අම්පාර මහ රෝහල වෙත ඇතුළත් වූ බවට අංක 770/2024 සහ 2024.05.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ සටහන් කර ඇත. ඒ අනුව සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ පසු අධිකරණය මගින් පැමිණිලිකරු හට ඇප ලබාදීමෙන් අනතුරුව ඔහු ඒවේලාවේදීම ප්‍රතිකාර ලබා ගැනීමට අම්පාර මහ රෝහල වෙත ඇතුළත් වූ බවට සිදු කර ඇති ප්‍රකාශය පිළිගත හැකි බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

එසේම, ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ දී ඔහුගේ ශරීරයේ තුවාල කිසිවක් නොතිබූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සටහන් යොදා තිබුණ ද, පැමිණිලිකරු පොලිස් නිලධාරීන් භාරයේ සිට අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහු රෝහල් ගත වී ඇති අතර, එහිදී ඔහුගේ ශරීරයේ මොට ආයුධයකින් සිදු වූ බරපතළ නොවන තුවාල ත්‍රිත්වයක් ඇති බවට ඉහත කී අංක 770/2024 සහ 2024.05.28 දිනැති

අධිකරණ වෛද්‍ය වාර්තාවේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සඳහන් කර ඇති බැවින් එකී තුවාල පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී සිදු වී ඇති බවට තහවුරු වේ.

තවද, පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඔහු සමඟ සිටි ඥාති සහෝදරයා වන අම්පාර, දමන, බක්මීටියාව, 41.A ලිපිනයේ පදිංචි කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් කොමිෂන් සභාව වෙත 2024.06.06 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇත. ඒ අනුව 2024.05.27 වන දින තමා තම ඥාති සහෝදරයා වන මනෝජ් අසංක (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) සමඟ යතුරු පැදි දෙකකින් පැමිණෙන අවස්ථාවේ මනෝජ් අසංක ගේ මව දුරකථනයෙන් කතා කර පොලීසියෙන් පැමිණ නිවස පරීක්ෂා කරන බව දැන්වීම නිසා ප.ව. 1.00 පමණ මනෝජ් අසංකත්, තමාත් බක්මීටියාව බලා එන අතරමගදී බක්මීටියාව ගම ආසන්නයේදී දමන පොලිස් ස්ථානයෙන් බව පවසා හතර දෙනෙකු ඔවුන්ව නවතාගත් බවත්, ඔවුන්ව හා යතුරු පැදි පරීක්ෂා කළ බවත්, මනෝජ් අසංක යන අයව රඳවා ගත් බවත්,  තමාට ගෙදර යන ලෙස අණ කළ බවත් සඳහන් කර ඇත. එසේම, තමා පිටව ගොස් විනාඩි 10ක් 12 ක් ඇතුළත නැවත මනෝජ් අසංක සිටි ස්ථානයට ගිය අවස්ථාවේ තමාට ඉතා අශෝභන ලෙස පොලිස් නිලධාරීන් විසින් බැන වැදුන බවත්, ඒ වන විටත් මනෝජ් අසංක හට මාංචු දමා තිබූ බවත්, පොලිස් නිලධාරීන් විසින් මනෝජ් අසංක සතුව ගංජා ඇති බව ප්‍රකාශ කර ඔහුව දමන පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් සඳහන් කර ඇත.

එමෙන්ම, එදින සවස මනෝජ් අසංක යන තම ඥාති සහෝදරයා බැලීමට පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේ, පොලිස් ස්ථානය වෙත ගෙන එන අතරතුරදී පොලිස් නිලධාරීන් විසින් ඔහුගේ බෙල්ල, පිට, කකුල්, යටි පතුල් වලට පහර දුන් බව ඔහු විසින් තමාට පැවසූ බවත්, පහරදීම හේතුවෙන් ඔහු අපහසුතාවයකින් පෙළෙන බව තමා දුටුව බවත්, ඔහුට පහර දීමෙන් තැලී ඉදිමී තිබූ ඔහුගේ යටි පතුල්, කකුල් තමා දුටු බවත්, ඔහුගේ පිට කොන්ද රිදෙන බව ඔහු පැවසූ බවත්, එහිදී ඔහුව රෝහල් ගත කරන ලෙස ඔහු තමාගෙන් ඉල්ලූ බවත් කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් වැඩිදුරටත් දක්වා ඇත. එසේම, තමා සමඟ කිසිදු අපහසුතාවයකින් තොරව පැමිණි තම ඥාති සහෝදරයා වන මනෝජ් අසංක යන අය මෙලෙස අපහසුතාවයෙන් සිටීම තුළින් 2024.05.27 වන දින ඔහු අත්අඩංගුවට ගත් පසු දමන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ඔහුට පහර දී ඇති බව තමා හට ප්‍රකාශ කළ හැකි බවත් කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් තවදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේ දී කිසිදු අපහසුතාවයකින් තොරව සිටි බවත්, පසුව ඔහුව බැලීමට පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේ දී ඔහු ඉතා අපහසුතාවයෙන් සිටි බව තමා දුටු බවත් කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇති බැවින්, වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තමා හට පහරදුන් බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශය සනාථ වන බව පෙනී යයි.

## නිගමනය

ඉහත දක්වන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ බලපත්‍රයක් නොමැතිව ගංජා නොහොත් කැනබිස් සැටයිවා එල් ළඟ තබා ගැනීමේ වරදට ය. එහෙත් අත්අඩංගුවට පත්වන අවස්ථාවේ දී පැමිණිලිකරු සතුව ගංජා නොතිබූ බවට ඔහු විසින් ප්‍රකාශ කළ ද, එය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඔහු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැත. ඒ අනුව සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය වෙත පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතුවක් පැවතියේ ද යන්න තීරණය කිරීම ගැටලුකාරී වන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. කෙසේවෙතත් පැමිණිලිකරු සතුව ගංජා මත්ද්‍රව්‍ය තිබූ බවත්, ඔහු ඉදිරිපිටදී එහි ප්‍රමාණය මැන බැලූ බවටත් වගඋත්තරකාර පාර්ශවය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කර අති බැවින් ද, ඊට අදාළ අංක 16192/24 දරණ නඩුව තවමත් අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින බැවින් ද, කොමිෂන් සභාව වෙත ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොමැති බැවින් ද පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මේ අවස්ථාවේදී තීරණයක් ලබා දීමට කටයුතු නොකරයි.

එසේවුවද, පැමිණිලිකරු හට සිදු වූ බවට සඳහන් කරන ලද පහරදීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව ඔහුව පරීක්ෂා කිරීමේ දී පැමිණිලිකරුගේ ශරීරයේ පෙනීමට තුවාල කිසිවක් නොමැති බව 2 වන වගඋත්තරකාර උ. පො.ප. බණ්ඩාර නිලධාරියා විසින් සටහන් යොදා ඇත. එසේම, පැමිණිලිකරු අත්අඩංගුවට පත් 2024.05.27 වන දින උපසේවා රාජකාරියෙහි යෙදී සිටි කා.පො.සැ. 6589 සරෝජිනී නම් නිලධාරිනිය තමා විසින් පැමිණිලිකාර ඩබ්. මනෝජ් අසංක යන අය හරියාකාරව භාරගත් බවත්, ඔහුව පො.සැ 63670 විජේතුංග නිලධාරියා යොදවා පරීක්ෂා කළ බවත්, මතුපිටින් පෙනීමට තුවාල හෝ අසනීප නොමැති බවට එකී නිලධාරියා විසින් දන්වා සිටි බවත් සටහන් කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඔහු සමඟ සිටි ඥාති සහෝදරයා වන අම්පාර, දමන, බක්මිටියාව, 41.A ලිපිනයේ පදිංචි කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් කොමිෂන් සභාව වෙත 2024.06.06 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, තම ඥාති සහෝදරයා වන මනෝජ් අසංක යන අය පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් අනතුරුව තමා ඔහුව බැලීමට ගිය අවස්ථාවේදී ඔහුහට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට ඔහු තමා සමඟ පැවසූ බවත්, තමා සමඟ කිසිදු අපහසුතාවයකින් තොරව පැමිණි තම ඥාති සහෝදරයා වන මනෝජ් අසංක යන අය, පොලිස් නිලධාරීන්ගේ අත්අඩංගුවට පත්වීමෙන් පසු පොලිස් ස්ථානයේ දී විවිධ ශාරීරික අපහසුතාවයන්ට ලක්ව සිටීම තුළින් 2024.05.27 වන දින ඔහු අත්අඩංගුවට ගත් පසු දමන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ඔහුට පහර දී ඇති බව තමා හට ප්‍රකාශ කළ හැකි බවත් ය.

තවද, පැමිණිලිකරුට නිකුත් කර ඇති අංක 770/2024 සහ 2024.05.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පැමිණිලිකරුගේ ශරීරයේ මොට ආයුධයකින් සිදු වූ

බරපතළ නොවන තුවාල ත්‍රිත්වයක් ඇති බවටත්, එකී තුවාල පැමිණිලිකරු විසින් තමා හට පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදු කළ බවට වන ඉතිහාසය සමඟ සැසඳෙන බවටත් සඳහන් කර ඇත. පහරදීමක් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ප්‍රබලම සාක්ෂියක් වශයෙන් සැලකිය හැකි වන්නේ අධිකරණ වෛද්‍ය වාර්තාව ය. එසේ හෙයින් ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ දී ඔහුගේ ශරීරයේ තුවාල කිසිවක් නොතිබූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සටහන් යොදා තිබුණ ද, පැමිණිලිකරු පොලිස් නිලධාරීන් භාරයේ සිට අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එදිනම ඔහු රෝහල් ගත වී ඇති අතර, එහිදී ඔහුගේ ශරීරයේ පහරදීමකින් සිදු වූ බවට සැලකිය හැකි මොට ආයුධයකින් සිදු වූ බරපතළ නොවන තුවාල ත්‍රිත්වයක් තිබූ බවට අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇති බැවින් එකී තුවාල පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී සිදු වී ඇති බවට තහවුරු වේ.

2024.12.27 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ තමා අත්අඩංගුවට ගැනීමට පැමිණි පොලිස් නිලධාරීන් සිව්දෙනා අතරින් පාලිත මහතා හැර අනෙක් නිලධාරීන් විසින් ගංජා ඉල්ලමින් තමාගේ කකුල් දෙකට සහ තුනටියට පහර දුන් බවයි.

<u>අමල් සුදත් සිල්වා</u> එ. <u>පො.ප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

ඒ අනුව ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරු වෙත නිකුත් කර ඇති අංක 770/2024 සහ 2024.05.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව සහ කපිලසිරි නිරෝෂ ලක්මාල් යන අය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2024.06.06 දිනැති දිවුරුම් ප්‍රකාශය ප්‍රකාරව පැමිණිලිකරු හට සිදු බවට සඳහන් කරන ලද පහරදීම තහවුරු වන බැවින්, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ නිලධාරීන් සිව්දෙනා අතරින් පැමිණිලිකරු විසින් තමාට පහර නොදුන් බව සඳහන් කර ඇති 5 වන වගඋත්තරකාර පො.කො. 96027 පාලිත නිලධාරියා හැර අනෙක් නිලධාරීන් තිදෙනා වන 2 වන වගඋත්තරකාර උ.පො.ප. බණ්ඩාර, 3 වන වගඋත්තරකාර පො.සැ. 19538 සුමනසේකර සහ 4 වන වගඋත්තරකාර පො.සැ. 39481 ලක්මාල් යන නිලධාරීන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 5 වන වගඋත්තරකාර පො.කො. 96027 පාලිත නිලධාරියා විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී වී තිබුණ ද, එම නිලධාරියා විසින් පැමිණිලිකරු හට පහරදීම් සිදු කර ඇති බවට

කරුණු අනාවරණය නොවන බැවින් මෙම සිද්ධියට අදාළව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ඔහු වෙත වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

එසේම, පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇති ආකාරයට අදාළ පහරදීම සිදුව ඇත්තේ පොලිස් ස්ථානයෙන් බැහැර ස්ථානයකදී වන බැවින් ඒ සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර දමන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (හිටපු) ප්‍ර.පො.ප. ඩී. එම්.එන්. මනෝජ් දිසානායක මහතා වෙත ද වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 12 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය